ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறிஸ் மாவத்தை, கொழும்பு 07.
No 07, Gregory's Avenue, Clombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2684051

ඊමේල් / ஈ-மெயில் / E- mail } Landcom@sltnet.lk

මගේ අංකය / எனது இல. / MY NO } 5/2/6/2008,

ඔබේ අංකය / உமது இல. / YOUR NO }

දිනය / திகதி / DATE } 2008.04.3

චක්‍ර ලේඛ අංක- 2008/2

සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත.

## ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති ප්‍රදාන පත්‍රවල අනුප්‍රාප්තිය නම් කිරීම හා අවලංගු කිරීම.

## ඉ.කො.155 ආකෘති ලියාපදිංචි කිරීම.

ඉහත කරුණ සම්බන්ධව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සියලු ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් ඇමතූ ප්‍ර/නො01/19/ඉ.ස/ චක්‍ර 2008 සහ 2008.02.08 උපදෙස් ලිපියේ පිටපතක් මේ සමඟ එවමි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති ප්‍රදාන පත්‍ර වල අනුප්‍රාප්තිය නම් කිරීමේදී අදාල ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ නොකර ලියාපදිංචි කිරීම නිසා එවැනි ලේඛන වෙනස් කරමින් නම් කරන ලද පසු උරුම කරුවන් වෙනස් කිරීමේ සිදුවීම් කීපයක් දිවයිනේ ස්ථාන කීපයකින් වාර්ථා වී ඇත. මෙ මගින් මියයිය ප්‍රදාන පත්‍ර ලාභීන්ගේ අවසාන කැමැත්ත ඒ ආකාරයෙන් ඉටු නොවන නිසා එවැනි තත්ත්වයක් ඇති වීම වැලැක්වීමට පියවර ගත යුතුව ඇත. දැනට කෙරෙන පරීක්ෂණ අනුව මෙවැනි කුඨ ලේඛන සකස් වී ඇත්තේ ඉ.කො.155 ආකෘතිය සම්පූර්ණ කිරීමේදී දී ඇති උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීමයි. එබැවින් ඉ.කො.155 ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කරවීම සම්බන්ධව සියලු පාර්ශව දැනුවත් කිරීමටත් මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. නිසි පරිදි සම්පූර්ණ නොකරන ඉ.කො.155 ආකෘති ඉදිරියේදී ලියාපදිංචි නොකර ප්‍රතික්ෂේප කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් කටයුතු කරනු ඇත.

### ඉ.කො.155 ලේඛන සහතික කිරීමට බලය ලත් තැනැත්තන්.

මෙම ලේඛන සහතික කිරීමට ඉඩම් සංවර්ධන ආඥාපනතේ 56 (1) වගන්තිය යටතේ පහත තනතුරු දරන්නන් වෙත බලතල ලබාදී ඇත.

- දිසාපති වරයා
- ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා
- ප්‍රාදේශීය සහකාර දිසාපති වරයා / ප්‍රාදේශය ආදායම් නිලධාරී.
- ප්‍රසිද්ධ නොතාරිස්
- සමාදාන විනිශ්චයාකාරවරයා

කාර්යාලය / பொது / General } 2677166 | ආයතන / நிர்வாகம் / Establishment } 2671173 | ගිණුම් / கணக்கு / Accounts } 2675574 | ඉඩම් / காணி / Land } 2675576 | සංවර්ධන / அபிவிருத்தி / Development } 2677293

## ඉ.කො.155 ලේඛනය සම්පූර්ණ කිරීම.

**ඉ.කො.155 ආකෘති පත්‍රය ප්‍රධාන කොටස් 4 කින් සමන්විතය.**

(i) පළමු පිටුව - ප්‍රදාන පත්‍ර කරුගේ ප්‍රකාශය .
(ii) දෙවන පිටුව - ප්‍රදාන පත්‍ර කරුගේ ප්‍රකාශය සහතික කිරීම .
(iii) තුන්වන පිටුව - අනුප්‍රාප්තිකයන් ලෙස නාම කළ අයගේ විස්තර හා එ
එක් අය පත් කළ ඉඩමේ කොටස් පිළිබඳ විස්තර .
(iv) හතරවන පිටුව - නාම කිරීමකට අදාල නිතිමය උපදෙස් .

දැනට ක්‍රියාත්මක වන ආකාරය අනුව බොහෝ විට සිදුවන්නේ ඉ.කො.155 ආකෘතියේ දෙවන පි ප්‍රකාශකගේ අත්සන සහතික කිරීම එක් අයෙකුත් තුන්වන පිටුවේ එසේ නාම කරන කරුණු සහතික ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරන බවය. මෙහිදී එක් එක් කොටසේ නාම කිරීම් පිළිබඳව සාමූහික වගකී නොමැති බැවින් එම ලේඛනය වෙනස් කළ අවස්ථාවක සහතික කරන අය වගකීමෙන් නිදහස් වීමට උත් දරණ බව පෙනේ. <u>මේ නිසා මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නාම කිරීමක් හෝ අවලංගු කිරී සහතික කරන විට දෙවන පිටුව හා තුන්වන පිටුව යන ස්ථාන දෙකම එකම නිලධාරියෙකු විසින් සහ කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙමි.</u>

ඇතැම් විට ප්‍රදාන ලාභී විසින් දෙවන පිටුව වෙනත් අයෙකු ලවා සහතික කරවා ගෙන තුන්වෙනි පි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නාම කරවා ගැනීමට උත්සාහ ගන්නේ එහි නීත්‍යානුකූල තත්ත්වය ආරක්ෂා ව ආකාරයට නාම කිරීමට විය හැකිය. එවැනි විටක අවශ්‍ය උපදෙස් ලබාදී දෙවන පිටුව සහතික කල අය ලවා තුන්වන පිටුව සහතික කරවා ගැනීමට උපදෙස් දීම මැනවි.

### <u>ඉ.කො. 155 ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේදී පහත කරුණු ගැනද නියි අවධානය යො වීම අවශ්‍ය ය.</u>

(1) අනුප්‍රාප්තිකයා නාම කරනු ලබන ඉ.කො. 155 ආකෘති පත්‍රයේ 3 වන පිටුවේ අංක 2,3,4, තීරු නිසි පරි සම්පූර්ණ කිරීම අවශ්‍යය.

(11) අනුප්‍රාප්තිකයන් නාම කරනු ලබන්නේ එක් අයෙක් නම සම්පූර්ණ ඉඩම සඳහා නාම කිරීම කළ යුතුය. එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් නාම කරන්නේ නම් එක් එක් අයට හිමි කොටස පැහැදිලිව දැක්විය යුතු ඒ සඳහා මැනුම් පිඹුරක් ඇත්නම් එම කොටස එකී පිඹුර ඇසුරින් පැහැදිලි කිරීමද සුදුසුය. එවැනි අවස්ථාවක කොටස් සියල්ලේ එකතුව ප්‍රදාන පත්‍රයේ මුළු ඉඩමේ ප්‍රමාණයට සමාන විය යුතුය.

111) සහතික කරන්නා විසින් නාම කිරීමකින් පසුව වෙනත් නාම ඇතුලත් කළ නොහැකි වනසේ Z හැඩයෙන් ඉරක් ගසා එම තීරු වසා දැමිය යුතු අතර එම ඉරට යටින් තවත් අත්සනක් තැබිය යුතුය. <u>මෙ අනුව 3වන පිටුවේ සහතික කරන්නාගේ අත්සන් දෙකක් තිබීම අනිවාර්යය.</u>

(1v) සහතික කරන්නාගේ අත්සනට යටින් නිල මුද්‍රාව තිබිය යුතුය.

CamScanner